ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය
සමාජ අධ්‍යයන අංශය
සමාජ විද්‍යා සහතික පත්‍ර පාඨමාලාව - 2 වන මට්ටම
අවසාන පරීක්ෂණය
අධ්‍යයන වර්ෂය - 2007
කළමනාකරණය හැඳින්වීම : SSF 2302

කාලය : පැය තුනයි (03)

දිනය : 2007.10.09 වේලාව : ප.ව. 1.30 - ප.ව. 4.30

* ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න. එක් කොටසකින් අවම වශයෙන් එක ප්‍රශ්නයකටවත් පිළිතුරු සපයන්න.
* ඉතා පැහැදිලි අකුරින් පිළිතුරු සපයන්න.
* එක ප්‍රශ්නයකට ලකුණු (20) බැගින් දෙනු ලැබේ.

පළමුවන කොටස

1. "සංවිධානය" නමිවූ සංකල්පය අර්ථවත් අයුරින් අවබෝධ කරගැනීමට අපොහොසත් වීමෙන් සමාජයට මහත් හානියක් සිදුවිය හැක. මෙම ප්‍රකාශය සැලකිල්ලට ගනිමින් පහත සඳහන් කරුණු පැහැදිලි කරන්න.
   (අ) සංවිධානය නමිවූ සංකල්පයට දිය හැකි නිර්වචනය කුමක්ද? (ලකුණු 06)
   (ආ) මෙම සංකල්ප තේරුම් නොගැනීමෙන් ශ්‍රී ලාංකික සමාජයට සිදුවී ඇති හානිය කුමක්ද? (ලකුණු 08)
   (ඇ) සංවිධානයක් තුළ කළමනාකරණය වැදගත් වන අන්දම (ලකුණු 06)

2. (අ) අධිකාරය නමිවූ සංකල්පය ප්‍රගතිශීලීව අවබෝධ කරගැනීමෙන් සංවිධානයක් තුළ අපට බොහෝ ප්‍රශ්න විසඳිය හැක. සාකච්ඡා කරන්න. (ලකුණු 12)
   (ආ) රේඛීය සහ මාණ්ඩලික අධිකාරය යනුවෙන් අදහස් වන්නේ කුමක්ද? (ලකුණු 08)

3. (අ) සංවිධාන සටහනක් ඇඳ එහි ඇති වැදගත්කම කුමක්දැයි පැහැදිලි කරන්න. (ලකුණු 10)
   (ආ) මූලික පාලන ක්‍රියාදාමය යනුවෙන් හඳුන්වන්නේ කුමක්දැයි පැහැදිලි කරන්න. (ලකුණු 10)

දෙවන කොටස

4. කළමනාකරණය සම්බන්ධව ඔබ දන්නාවූ ගුරුකුල හතරක් (04) පිළිබඳව සාකච්ඡා කරන්න. (ලකුණු 20)

5. සැලසුම්කරණය නමිවූ සංකල්පය අවබෝධ නොකරගැනීමෙන් සංවිධානයකට කල හැකි සේවය සීමිතය. සාකච්ඡා කරන්න. (ලකුණු 20)

6. කළමනාකරුවෙකු තුළ නායකයෙකුගේ ගති ලක්ෂණද තිබීම වැදගත් වන්නේ ඇයි දැයි ශ්‍රී ලාංකික සංවිධානවල යථාර්තය ආශ්‍රිතව සාකච්ඡා කරන්න. (ලකුණු 20)

තෙවන කොටස

7. (අ) සංවිධානයක් තුළ අභිප්‍රේරණය නම්වූ සංකල්පයට වඩාත් ගරුකිරීමෙන් ලබාගත හැකි වාසි බොහෝය. සාකච්ඡා කරන්න. (ලකුණු 10)

(ආ) මැස්ලෝගේ මිනිස් අවශ්‍යතා ධුරාවලිය තුළින් පෙන්නුම් වන යථාර්තය කුමක්ද? (ලකුණු 10)

8. (අ) කාල කළමනාකරණය පිළිබඳව දියුණුවෙමින් පවතින රටවල මිනිසුන් ඇතිකරගත යුත්තේ ගැඹුරු අදහසකි. සාකච්ඡා කරන්න. (ලකුණු 10)

(ආ) කාල කළමනාකරණය පිළිබඳව පැරටෝගේ 80/20 සිද්ධාන්තය තුළින් අපට ලබාගත හැකි පණිවිඩය කුමක්ද? (ලකුණු 10)

9. ආයතනික සංවර්ධනය උදෙසා සන්නිවේදන ක්‍රියාවලියේ ඇති වැදගත්කම පැහැදිලි කරන්න. (ලකුණු 20)

***** සියළුම හිමිකම් ඇවිරිණි *****

ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය
සමාජ අධ්‍යයන අංශය
සමාජ විද්‍යා සහතික පත්‍ර පාඨමාලාව - 2 වන මට්ටම
අවසාන පරීක්ෂණය
අධ්‍යයන වර්ෂය - 2007
ජනසන්නිවේදනය හැඳින්වීම : SSF 2303

කාලය : පැය තුනයි (03)

දිනය :2007.10.10 වේලාව : ප.ව. 1.30 - ප.ව. 4.30

ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න. සෑම පිළිතුරක් සඳහාම ලකුණු විස්සක් (20) ලැබේ.

1. සාර්ථක මාධ්‍ය සම්මුඛ සාකච්ඡාවක් සඳහා සැලකිය යුතු මූලික අවශ්‍යතා මොනවාදැයි පහදන්න.

2. තොරතුරු ලබාගැනීමේ නිදහස සමාජීය අයිතියක්ද? සාකච්ඡා කරන්න.

3. ප්‍රවෘත්ති යනුවෙන් අදහස් වන්නේ කුමක්දැයි ජනසන්නිවේදන දෘෂ්ඨිකෝණයෙන් පහදන්න.

4. යටිතුරු පිරමිඩ සංකල්පය සැලකිල්ලට ගෙන ප්‍රවෘත්ති වාර්තාවක් සකසන්න.

5. ගවේශනාත්මක ප්‍රවෘත්ති කලාවේ මූලික කාර්යය වන්නේ ජාතික සංවර්ධනයට අහිතකර දැ හෙළිදරව් කිරීමයි. අදහස් දක්වන්න.

6. සාර්ථක මාධ්‍ය වැඩසටහනක් නිෂ්පාදනය කිරීමේදී ග්‍රාහක සමීක්ෂණ ප්‍රයෝජනවත් වන්නේ කෙසේදැයි විස්තර කරන්න.

7. ශ්‍රී ලංකාවේ පුවත්පත් කලා වර්ධනයේ වැදගත් ඓතිහාසික අදියරයන් ගෙනහැර දක්වන්න.

8. රූපවාහිනී මාධ්‍යයේ ප්‍රබලතා හා දුබලතා මොනවාදැයි දක්වන්න.

9. පහත සඳහන් මාතෘකා ගැන කෙටි සටහන් ලියන්න.
   1. මානව හිමිකම් පිළිබඳ වූ විශ්ව ප්‍රකාශනය
   2. න්‍යාය පත්‍ර සැකසීමේ ක්‍රියාවලිය
   3. ජනමත නායකයා
   4. ප්‍රකාශන අයිතිය

***** සියළුම හිමිකම් ඇවිරිණි *****